# The Abstract

**<u>" A study on the psycho-social background factors affecting the development of high level skills in school children"</u>**

Since the development of skills is crucial in education the present study will be relevant and useful for parents, teachers, school management, curriculum developers and education policy makers.

The study is done on a purposive sample of ten high achievers in eight schools. The backgrounds of their families, and schools were studied along with their level of self-motivation and time management habits. Their fields of achievement were music, dancing, arts, sports, and academic abilities in grade five from grades 3 to 11, using mainly the descriptive case study method. The selection criteria of children were recognition and awards wining at national level. Since the psychosocial background is a vast field, the research focused on ten aspects. Parents' recognition and motivation, involvement, coming into contact with resource persons in home background, wellbeing habits and special training given to children were determined.

Secondly in the school background the factors of recognition by teachers, teachers' guidance, resource persons' association, additional training and opportunities given for presentation of skills, and opportunities given to participate in school and interschool events were studied. Thirdly the child's self-motivation and wellbeing and time management habits were considered. The researcher used semiformal interviews with the children, their parents and school teachers The above mentioned aspects of home, school and self-motivation were identified as they emerged from the preliminary survey.

The background factors of family, school and personal habits were evaluated using a six scale instrument.

The analysis of data led the researcher to determine the following basic findings.

- Recognition of a child's potentials along with motivation and guidance are pre running factors in the development of his or her particular skill. They reinforce

the child's self-concept. Once the self-concept is built within, interest to pursue that particular field increases and as a result a special learning capacity arises.

- A skill development programme should be continuous until the child achieves high level of achievement. Such continuity saves the skill from extinction.
- High achievers are concerned with maintaining their wellbeing.
- Skills in self-management and time management are necessary for pursuing the goals of high achievement.
- The present school system in Sri Lanka tend to go children's inborn skills due to the factors like over crowing of the classroom, excessive priority and emphasis given to cognitive learning , lack of teachers knowledge and interest on gifted children.
- Children's recognize and develop their special skills more in engaging in co-curricular activities.
- Children's interest in particular fields merge in coming with contact with competent resource persons, whom they tend to take as life guiding ideals.
- Teacher's interests are contagious to their students.
- The deciding factor of skill development is their level of self-motivation despite of the external facilities given.
- Effective self-learning skills are necessary in successful leaning achievement.
- The recommendations are developed from recognized the above given findings.

## සාරාංශය

ළමයින්ගේ දක්ෂතා හා කුසලතා සංවර්ධනය කිරීම, අධ්‍යාපනයේ ප්‍රමුඛත ම කාර්යයක් වන වන බැවින් මෙම අධ්‍යයනය ළමා සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන, මවුපියන්ට, ගුරුභවතුන්ට, පාසල් පරිපාලකයන් යනාදීන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

පාසල් 8කින් අභිලාෂී නියැදියක් වශයෙන් තෝරා ගත් සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කළ සිසු සිසුවියන් 10 දෙනෙකුගේ පවුලේ මනෝ සමාජයීය තත්ත්වයන්, පාසලේ මනෝ සමාජයීය තත්වයන් මෙන් ම ස්වයං අභිප්‍රේරණය හා ස්වයං කළමානකරණය පිළිබඳ ව මෙහිදී අධ්‍යයනය කරන ලදි. ඔවුන්ගේ සුවිශේෂී දක්ෂතා ක්ෂේත්‍ර වූයේ සංගීතය, නර්තනය, චිත්‍ර කලාව, ක්‍රීඩා හා ශාස්ත්‍රීය විෂය සාධනයයි (5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ජය). 3 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය අතර සිටි ඔවුන් එකිනෙකා වශයන් ගෙන ප්‍රත්‍යෙක අධ්‍යයනය ක්‍රමය මගින් ඉහත කී පසුබිම් සිද්ධි අධ්‍යයන තොරතුරු ලබා ගන්නා ලදි. ඔවුන් තෝරා ගත් දර්ශකයන් වූයේ, එම ක්ෂේත්‍රවලින් ජාතික මට්ටමේ පිළිගැනීම හා සම්මාන ලබා සිටීමයි.

පෙර දැක් වූ පරිදි පසුබිම් සිද්ධි අධ්‍යයනයට අදාළ තොරතුරු ලබා ගන්නා ලද්දේ, මවුපියන් වෙතින් දක්ෂතාව හඳුනා ගැනීම, දිරි ගැන්වීම, කැපවීම හා සම්පත් පුද්ගලයින්ගේ ඇසුරට යොමු කිරීම, මාර්ගෝපදේශය හා විශේෂ පුහුණුව ලබා දීම හා නිවස තුළ වූ යහපැවතුම් ආදිය පිළිබඳ විමර්ශනයෙනි.

දෙවැනි ව පාසලේදී එම දක්ෂතා වර්ධනය කෙරෙහි ඔවුන්ට බලපාන ලද කරුණු වූ, ගුරුවරුන් වෙතින් දක්ෂතාව හඳුනා ගැනීම, ගුරු මාර්ගෝපදේශය, විශේෂඥ ගුරුවරුන්ගෙන් ලද පුහුණුව හා පාසල් ප්‍රසංග මෙන් ම නිවාසාන්තර හා අන්තර් පාසල් තරගවලට සහභාගි වීමට අවස්ථා දීම යනාදිය කෙබඳු ආකාරයෙන් සිදු වී ඇත්ද යන්න අධ්‍යයනය කරන ලදි.

තුන්වැනි ව ළමයින්ගේ ස්වයං අභිප්‍රේරණ මට්ටම, යහ පැවතුම් පුරුදු හා ස්වයං කාල කළමනාකරණය ආදිය පිළිබඳ ව අධ්‍යයනය කරන ලදි. පර්යේෂකයා එකී තොරතුරු ලබා ගැනීමට භාවිත කරන ලද්දේ, නිරීක්ෂණය, අර්ධ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමයන් ය.

පවුල්, පාසල් හා ස්වයං අභිප්‍රේරණය six scale උපකරණයක් මගින් සටහන් කර ගන්නා ලදි. එසේ ලබා ගත් දත්ත විශ්ලේෂණයෙන් හා අර්ථකථනයෙන් පහත දැක්වෙන පොදු නිගමනවලට පැමිණීමට හැකි විය.

- ළමයෙකුගේ විභව කුසලතා හා හඳුනා ගනු ලැබීම, ඇගයීම, දිරි ගැන්වීම හා මග පෙන්වීම එම ළමයාගේ විභව කුසලතා සංවර්ධනයේ පූර්වගාමී සාධක වේ. ස්වයං

අභිප්‍රේරණය ගොඩ නැගීමත් සමඟ එම කුසලතා වර්ධනය කර ගැනීමට ළමයා නැඹුරු වේ.

- හඳුනා ගෙන වර්ධනය කර ගැනීමට යොමු වූ කුසලතා ප්‍රගුණ කිරීමේ පරිපාකය කරා වර්ධනය වන තුරු අඛණ්ඩව කර ගෙන යාම අවශ්‍ය වේ. එසේ නොවන විට ළමයා ආපසු මුල් තත්ත්වයට වැටේ.
- කුසලතා සංවර්ධනය සමඟ ඵලදායී යහපැවතුම් ජීවන පුරුදු එක්ව යනවිට, නිෂ්ධාර්ථ සාධනය ඉක්මන් වේ.
- සුවිශේෂී දක්ෂතා වර්ධනය කර ගැනීමේ ඵලදායී පැවතුම් අතර, ස්වයං කළමනාකරණය හා කාල කළමනාකරණය ප්‍රමුඛ වේ.
- වර්තමාන පාසල් පද්ධතියේ තදබද පන්තිකාමර තුළ විෂය ඉගෙනුම් අවධාරණය, විභාග කේන්ද්‍රීය ඉගැන්වීම හා නිසා අවබෝධයක් ගුරුවරුන්ට නොතිබීම හේතුවෙන් ළමයින්ගේ විභව ශක්තීන් ගුරු නිරීක්ෂණයට හසු නොවී, නොසලකා හරිනු ලැබීමේ ප්‍රවණතාවක් පවතී.
- ළමයින්ගේ විභව ශක්ති උද්දීපනය බෙහෙවින් සිදු වන්නේ, විෂය සමගාමී ක්‍රියාකාරකම් මගිනි.
- ඒ සඳහා ප්‍රවීණ හා නිර්මාණශීලි ගුරු ඇසුර හා සහය ප්‍රමුඛ සාධකයන් වේ.
- ගුරු ලැදියා සිසුන් තුළ බෝ වී යන බව පෙනේ.
- සවුපියන් හා පාසල කෙරෙන් කවර පහසුකම් ලැබුණත් අවසානයෙහි ශිෂ්‍යයාගේ ස්වයං අභිප්‍රේරණය හා පූර්වගාමී ප්‍රබල සාධකය වේ.
- හුදෙක් සිසුවාට උගන්වනු වෙනුවට සිසුවා තුළ ඵලදායී ඉගෙනුම් කුසලතා වැඩි දියුණු කිරීම සාර්ථක ඉගෙනුම් සඳහා අවශ්‍ය වේ.
- ඉහත නිගමන කෙරෙන් අධ්‍යයන යෝජනා සකස් කර ගන්නා ලදි.